**සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**02 ශ්‍රේණිය**

**ජුනි 04 වන සතිය**

**විෂය සමගාමී ක්‍රියාකාරකම්**

**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**

**සැකසුම - ආර්.එම්.එස්. රත්නායක මිය, කෑ/ දෙහි/යටිවල කණිෂ්ඨ විද්‍යාලය , දැරණියගල.**


# <u>කුරුමිණියා නිර්මාණය කරමු.</u>

<u>අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය</u>


- ★ රතු, කළු, සුදු A4 කඩදාසි
- ★ කතුරක්
- ★ හිස් යෝගට් කෝප්පයක්
- ★ ගම්

- ★ **දෙමාපියන්ගේ සහය ලබා ගන්න.**


- යෝගට් කෝප්පයේ මුහුණත තබා කළු කඩදාසියේ රවුමක් අඳින්න. රතු කඩදාසියේ රවුම් දෙකක් අඳින්න. රවුම් කපා ගන්න.
- යෝගට් කෝප්පයේ යටි පැත්ත කළු කඩදාසියේ තබා රවුමක් අඳින්න. රවුම කපා ගන්න.
- රවුම් දෙක පහත රූපයේ පෙන්වා ඇති ආකාරයට අලවන්න.



- සුදු කඩදාසියෙන් කුඩා රවුම් දෙකක් කපා ඇස් අලවන්න.කළු පාට කඩදාසියෙන් තීරු දෙකක් කපා පහත රූපයේ පෙන්වා ඇති ආකාරයට තුඩු අලවන්න.



- රතු පාට රවුම් දෙක හරි මැදින් දෙකට නවන්න. පහත රූපයේ පෙන්වා ඇති ආකාරයට අලවන්න.



- කළු පාට කුඩා රවුම් කිහිපයක් කපා ගන්න.
- රතුපාට රවුම් වල තැනින් තැන කළු පාට රවුම් අලවන්න.
- මුද්දක් වගේ මැද ඇඟිල්ලේ රැඳවිය හැකි රවුමක් සාදා අලවා ගන්න.
- නිර්මාණය යටි පැත්ත හරවා කළු රවුම් දෙක ඇලවූ ස්ථානයේ ගම් ටිකක් තවරා මුද්ද සවි කරගන්න.දැන් මුදුව මැද ඇඟිල්ලේ රඳවා කුරුමිණියා චලනය කරමින් කතා කරන්න.